දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ද්විතීය භාග 2013 පරීක්ෂණය - 2016 ජනවාරි/පෙබරවාරි
Bachelor of Arts General (External) Degree Part II 2013 Examination – January/February 2016

# සිංසා 3.2 - නූතන ප්‍රබන්ධකථා කලාව
# SLG 3.2 - Modern Fiction

කාලය පැය තුන යි

එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් (02) තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න
(අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු විය හැකි ය)

---

## පළමු කොටස

01. "ප්‍රබන්ධකථා යනු සංකල්පිය චරිත සහ විස්තර ආශ්‍රිත ව නිර්මාණය කෙරෙන සප්‍රයෝජනවත් සාහිත්‍ය ප්‍රකාශනයකි." අභිමත ප්‍රබන්ධකථා තුනක්වත් නිදසුන් කොට ගනිමින් මේ අදහස පිරික්සන්න.

02. පියදාස සිරිසේන ස්වකීය ප්‍රබන්ධකථා ආශ්‍රයෙන් ප්‍රචලිත කළ මතවාදය යටත්විජිතහරණය සඳහා හේතු වූයේ ද යි සාකච්ඡා කරන්න.

03. "සරල විනෝදාස්වාදය පාඨක සිත්හි ජනිත කොට පොදු පාඨකයා පිනවීම ඩබ්.ඒ. සිල්වාගේ කථා කලාවේ එක් අරමුණකි." නිදසුන් ආශ්‍රිත ව සාකච්ඡා කරන්න.

04. කෙටිකතාවක විශ්වසනීයත්වය සහ එහි සියලු අංග අතර අන්‍යොන්‍ය සම්බන්ධය රැකගැනීම වෙනුවෙන් කතාවේ පසුතලය පිළිබඳ අනාවරණය කෙරෙන කරුණු කොතරම් උපයෝගී වන්නේ ද යි සනිදර්ශන ව පහදන්න.

## දෙවන කොටස

05. ලාංකේය ග්‍රාමීය සමාජයේ සිදු වූ විපරිණාමය <u>චරිත තුනක්</u> නවකථාවෙන් විග්‍රහ කොට ඇති ආකාරය පරීක්ෂා කරන්න.

06. <u>යුගාන්තය</u> නවකථාවේ නිරූපිත 'කම්කරු සටන්' කෘතියේ මුඛ්‍යාර්ථය උද්දීපනයෙහි ලා කවර ආකාරයෙන් හේතු කාරක වී ද යි පහදන්න.

07. ලෝකය දැකීමේ දී, අවබෝධ කර ගැනීමේ දී සහ ඒ පිළිබඳ තීරණ ගැනීමේ දී පුද්ගලයා සතු ව තිබිය යුතු ස්වාධීනත්වය <u>ලෝමාලිකා</u> කෙටි නවකථාවෙහි චරිත මගින් නිරූපණය වන්නේ ද යි නිදසුන් මගින් පැහැදිලි කරන්න.

08. "අන්තර් පුද්ගල සබඳතා විෂයයෙහි උද්ගත වන සංකීර්ණතා නිරූපණයෙහි ලා කෙටිකතාවේ කෙටිබව බාධාවක් නො වේ." මගේ පරෙයි කුඩුව සහ වෙනත් ශ්‍රේෂ්ඨ කෙටිකතා කෘතියෙහි අන්තර්ගත කෙටිකතා තුනක්වත් ඇසුරෙන් පක්ෂ ව හෝ විපක්ෂ ව ඔබේ මතය සාධනය කරන්න.

*******************************************